**කින්නියා නගර සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින නගර සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාගයක් වශයෙන් සභාවට ලැබී සභාවේ නමින් තිබෙන ටිපර් සහ JCP යන්ත්‍රවල වටිනාකම් පිළිවෙළින් රු. 6,009,602 ක් සහ රු. 17,649,179 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) පුරනැගුම වැඩසටහන ප්‍රතිපාදන යටතේ රු. 1,508,212 ක වටිනාකමට ඉදිකර සභාව වෙත භාර දෙන ලද සංචාරක බංගලාව කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබීම නිසා ජංගම නොවන වත්කම්වල වටිනාකම මෙම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කුඩා කින්නියා මාළු වෙළඳ පොළ හිඟ බදුකුලිය, ලෙජරය අනුව රු. 1,770,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 770,000 ක් ලෙස පෙන්වා තිබීමෙන් මාළු වෙළඳ පොළ හිඟ බදු කුලිය රු. 1,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරය අනුව 2015 දෙසැම්බර් 31 වන දිනට ණය හිමි ශේෂය රු. 1,541,751 ක් වුවද, එදිනට ශේෂය පත්‍රය අනුව එම ශේෂය රු. 1,470,143 ක හර ශේෂයක් වශයෙන් පෙන්වා තිබීමෙන් ණය හිමි ශේෂය රු. 3,011,894 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලෙජරය අනුව 2015 දෙසැම්බර් 31 වන දිනට කොන්ත්‍රාත් තැන්පත් රු. 7,117,166 ක් වුවද, මූල්‍ය ප්‍රකාශය අනුව එදිනට ශේෂය රු. 6,757,166 ක් ලෙස දක්වා තිබීමෙන් කොන්ත්‍රාත් තැන්පත් රු. 360,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.3 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත (අධිකාරය 255) 177(2) වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය මහජනයා විසින් දැන ගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කිරීමට 2016 අගෝස්තු 30 වන දින දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 | මුදල් හා ගබඩා භාරව කටයුතු කිරීම සඳහා පරිපාලනමය වශයෙන් භාරදී තිබූ නිලධාරීන් පස් දෙනාගෙන් ආරක්ෂක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංකය 04/2015 | රජයේ ආයතන මෝටර් වාහන රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා රක්ෂණ නියෝජිතයන් මාර්ගයෙන් ලබා නොගත යුතු බව සඳහන් වුවද සභාව සතු වාහන හතරක රක්ෂණ ආවරණ රක්ෂණ නියෝජිතයන් මගින් ලබාගෙන තිබුණි. |

**1.3.4 බලය නොලත් ගනුදෙනු**

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11.6 වන වගන්තියට අනුව නිලධාරියෙකුට මාස 12 කට වරක් පමණක් උත්සව අත්තිකාරම් ලබා දිය හැකිවුවද, සභාව විසින් එක් නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේදී දෙවරක් උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ නගර සභාවේ මෙහෙයුම් වලින් රු. 925,243 ක් පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 2,813,401 ක ආදායම් ඉක්මවූ වියදමක් වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තර | ඇස්තමේන්තුගත ආදායම් | තත්‍ය ආදායම් | 2015.12.31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් බදු | 3,927 | 1,455 | 1,742 |
| බදුකුලි | 10,944 | 3,873 | 11,340 |

**2.2.2 ආදායම් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයට අයත් හිඟ මස්කඩ බදුකුලි රු. 2,947,185 ක් සහ මාළු පොළ හිඟ බදුකුලි රු. 7,103,122 ක් වශයෙන් එකතුව රු. 10,050,307 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අයත් හිඟ සති පොළ බදුකුලි රු. 349,722 ක් හා කුකුල් මස් කඩ බදු කුලි රු. 17,666 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

**2.2.3 වරිපනම් බදු**

නගර සභා ආඥා පනත (අධිකාරය 255) 160 වන වගන්තියට අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ සමුච්චිත හිඟ වරිපනම් බදු රු. 1,741,969 ක් අයකර ගෙන නොතිබුණි.

**2.2.4 සන්නිවේදන කුළුනු ගාස්තු**

සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතනයක් විසින් ඉදි කර තිබූ සන්නිවේදන කුළුනු 04 ක් තිබුණද එවායින් 2013 වර්ෂය සිට 2015 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව ගාස්තු අයකර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 06 ක් වර්ෂ 11 ක කාලයකට වඩා වැඩි කාලයක් සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද, සභාවේ නමට මාරු කිරීම් සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව සේවකයන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍ර සවිකර නොතිබුණි.

(ඇ) සභාව විසින් ධාවනයේ යොදවා ඇති ත්‍රිරෝද රථය සමාලෝචිත වර්ෂයේ ධාවන සටහන්වල සටහන් නොකර කිලෝ මීටර් 868 ක් ධාවනය කර තිබුණි.

(ඇ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 16 ක් ගාල්කර තැබීම සඳහා අංගනයක් ඉදිකිරීම සඳහා කටයුතු නොකිරීමෙන් එම වාහනවල ආරක්ෂාව පිළිබද අවදානම් තත්ත්වයක් දක්නට ලැබුණි.

(ඉ) රු. 48,025 ක් වැයකර සමාලෝචිත වර්ෂයේ ආරම්භකර තිබූ අන්තර්ජාල පහසුකම් ක්‍රියාවිරහිත වී තිබුණද, එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කැනඩා ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයේ මූල්‍ය ආධාර යටතේ 2008 වර්ෂයේ නගර සභාවට ලබාදී සමාලෝචිත වර්ෂය අවසානයේ තිබුණු මහන යන්ත්‍ර 26 කින් 12 ක් හානියට වී නිශ්ක්‍රියව තිබුණද, ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3.2 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 වන දිනැති අංක 02/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තිය අනුව පළාත් පාලන ආයතනවල අනියම් සහ තාවකාලික පදනම යටතේ පත්කරන ලද සේවකයන් ගෙන් රාජ්‍ය සේවා අර්ථසාධන අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. එසේ වූවද, මෙයට පටහැනිව සභාවේ සේවය කළ සෙවකයින් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙනුවට සේවක අර්ථසාධන අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී තිබුණු අතර, 2012 ජනවාරි සිට 2015 අප්‍රේල් දක්වා සේවක භාරකාර අරමුදලේ දායක මුදල් හා 2014 මාර්තු සිට 2015 පෙබරවාරි මාසය දක්වා කාලයට අදාළ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නිශ්චිත කාලවලදී ගෙවා නොතිබීමෙන් එම අරමුදල් වලට දඩමුදල් වශයෙන් රු. 482,710 ක් ගෙවා තිබුණි.

(ආ) මහජන පුස්තකාලය, මහජන පොළ සහ මාළු වෙළඳ පොළවල ජල ගාස්තු අදාල දින වල ගෙවීමට නොහැකිවීමෙන් විසන්ධිකරන ලද ජල සැපයුම් නැවත ලබා ගැනීම සඳහා දඩ මුදල් වශයෙන් රු. 59,946 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**3.3 නිෂ්කාර්ය වත්කම්**

**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන යටතේ 2012 වර්ෂයේ දී රු. 219,254 ක මුදලකට මිලදී ගෙන තිබූ කොම්පොස්ට් පොහොර ටැංකි 51 කින් රු. 150,465 ක් වටිනා ටැංකි 35 ක් අදාල අරමුණු සඳහා බෙදානොදී වර්ෂ 04 ක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ආ) සභාවේ තිබෙන මෝටර් වාහන 03 ක් සහ රු. 5,098,000 ක් වටිනා ටිපර් රථයක් වර්ෂ හතරකට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**4** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්තය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| විධායක | 02 | - | - | 02 |
| සහායක | 40 | 30 | - | 10 |
| සුළු සේවකයින් | 67 | 73 | 06 | - |
| තාවකාලික දෛනික සේවකයින් | - | 14 | 14 | - |
| එකතුව | 109 | 117 | 20 | 12 |

සභාවේ ලේකම් තනතුර සහ ගණකාධිකාරී තනතුර පසුගිය වර්ෂ හයක සිට පුරප්පාඩුවී තිබුණද එය පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

**5** **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

| පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ලෙජර යාවත්කාලීනව පවත්වා නොතිබුණි.<br>(ii) වත්කම් වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණය කර නොතිබුණි. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) ආදායම් අයකිරීමේ පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |